# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2306/20 - 2022 නොවැම්බර් මස 15 වැනි අඟහරුවාදා - 2022.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**
**92 වැනි වගන්තිය යටතේ නියමය**

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල වන මම, එකී මණ්ඩලයට, හපුගස්තලාව ජල සම්පාදන ව්‍යාපෘතියේ හපුගස්තලාව ජල ගබඩා ටැංකිය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,
ජල සම්පාදන අමාත්‍ය.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැඳුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 460, හපුගස්තලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හපුගස්තලාව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 330309 කලාප අංක 7 න් 8 කලාපය පත්‍ර අංක 1 දරන පිඹුරේ කැබලි අංක 57න් කොටසක් වශයෙන් දැක්වෙන "බටගොල්ල ඔය පතන" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 30ක් පමණ වන ඉඩම් කොටස :

1A - G 38058 — 10 (2022/11)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| නැගෙනහිරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| දකුණට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා කැබලි අංක 58 |
| බටහිරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |

ඉඩමට හිමිකම් කියනන්නන්ගේ නම් සහ ලිපිනයන් :

1. නිහිමතුල්ලා නිෂාඩ් අහමඩ් මයා,
   අංක බී/303, මහවිල ජනපදය,
   හපුගස්තලාව.

2. නිහිමතුල්ලා නෂිල් අහමඩ් මයා,
   අංක බී/303, මහවිල ජනපදය,
   හපුගස්තලාව.

EOG 11 - 0151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.